බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs
සංස්කෘතික අංශය கலாசார பிரிவு Cultural Division

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. 8 ஆம் மாடி, செத்சிறிபாய பத்தரமுல்லை, ஸ்ரீ லங்கா
8th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka

මගේ අංකය / எனது இல / My No. CA/06/03/20/01 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date. 2023.11.

සංස්කෘතික කටයුතු චක්‍රලේඛ : CA/06/03/20/01/2022/1

සියලුම විශ්වවිද්‍යාලීය ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීන් වෙත,

**<u>විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානවල කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාම.</u>**

මෙම චක්‍රලේඛය 2024 ජනවාරි මස 01 දින සිට ඉදිරියට වලංගු වන අතර සියලුම විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථාන සෑම වර්ෂයකම ජනවාරි මස පළමු සතිය තුළ කුසලතා සංවර්ධන වැඩසටහන් අනිවාර්යයෙන්ම ආරම්භ කළ යුතුය.

## 01. <u>කුසලතා සංවර්ධන වැඩසටහන්</u>

### 1.1 මුදල් අය නොකිරීමේ පදනම මත පවත්වන කුසලතා සංවර්ධන වැඩසටහන්

විවිධ කලා කුසලතාවයන් හැදෑරීමට හා වැඩි දියුණු කර ගැනීමට විශ්වවිද්‍යාලවල අධ්‍යයන කටයුතුවල නිරත විද්‍යාර්ථයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට අවස්ථාව උදාකර දීම මෙම කුසලතා සංවර්ධන වැඩසටහන් තුළින් අපේක්ෂා කෙරේ. මේ යටතේ පහත සඳහන් ක්ෂේත්‍රයන් ඔස්සේ අධ්‍යාපන වැඩසටහන්/ පාඨමාලා සකස් කර වර්ෂය පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීම අවශ්‍ය වේ. මෙම සියලුම පාඨමාලා මුදල් අය නොකිරීමේ පදනම මත පවත්වාගෙන යා යුතු වේ.

**i. නර්තන වැඩසටහන්**

- ❖ උඩරට නර්තනය
- ❖ පහතරට නර්තනය
- ❖ සබරගමු නර්තනය
- ❖ ජන නැටුම් හා නව නිර්මාණ
- ❖ භරත නාට්‍යම්
- ❖ තූර්යවාදන පාඨමාලා (බෙර වාදන පාඨමාලා ද ඇතුළත් වේ.)

**ii. සංගීත වැඩසටහන්**

- ❖ පෙරදිග සංගීතය
- ❖ ජන සංගීතය
- ❖ බටහිර සංගීතය (අපරදිග)
- ❖ පියානෝ, වයලීන්, ගිටාර් වාදනය
- ❖ කර්ණාටක සංගීතය
- ❖ මෘදංගම් වාදනය
- ❖ වීණා වාදනය

දුරකථන අංකය / தொலைபேசி இல / Telephone No.
අමාත්‍ය / அமைச்சர் / Minister 011-2861147
ෆැක්ස් / தொலைநகல் / Fax. 011-2861107
ලේකම් / செயலாளர் / Secretary 011-2861108
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2872004
ඊමේල් / மின்னஞ்சல் / E-mail. culturalsecoffice@gmail.com
කාර්යාලය / அலுவலகம் / Office 011-2872001 011-2876586 011-2872023
ෆැක්ස් / தொலைநகல் / Fax. 011-2872024
ඊමේල් / மின்னஞ்சல் / E-mail. culturalmin@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site. www.cultural.gov.lk

iii. නාට්‍ය හා රංගකලාව
iv. **චිත්‍ර, මූර්ති හා කලා ශිල්ප (කැටයම් කලාව)**
v. **වෙනත් භාෂා පාඨමාලාවන් (දෙමළ/ ඉංග්‍රීසි භාෂා පාඨමාලා හා දෙමළ සිසුන් සඳහා සිංහල භාෂා පාඨමාලාව ද ඇතුළත් වේ.)**
vi. **ඡායාරූප කලාව**
vii. **මනෝවිද්‍යා උපදේශනය**

### 1.2 සහනදායි ගාස්තු අය කිරීම යටතේ පවත්වන කුසලතා සංවර්ධන වැඩසටහන්

විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානවල සංවර්ධන සංගමයේ අරමුදල සඳහා දායකත්වයක් ලබා ගැනීමේ පදනමින් සහනදායි ගාස්තු අය කිරීම යටතේ විශ්වවිද්‍යාලයේ පැවැත්වීමට සුදුසුයැයි හැඟෙන වෙනත් කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යා හැකිය. ගාස්තු අයකිරීමේදී බාහිර ආයතනවලට වඩා අඩු මුදලක් අය කළ යුතුය. මේ සඳහා සංවර්ධන සංගමයේ ලදු පතක් නිකුත් කළ යුතුය. පාඨමාලා ගාස්තුවෙන් 15% ක් සංවර්ධන සංගමයේ අරමුදල සඳහාත්, ඉතිරි මුදල සම්පත්දායක දීමනා ගෙවීම සඳහාත් යොදාගත යුතු වේ.

සහනදායි ගාස්තු අය කිරීම යටතේ පවත්වන කුසලතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධව සාධාරණීයකරණ වාර්තාවක් ඉදිරිපත් කර අමාත්‍යාංශයේ සංස්කෘතික වැඩසටහන් ඒකකයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්වෙන කුසලතා සංවර්ධන වැඩසටහන් පිළිබඳව මාසික ප්‍රගති වාර්තාව පර්යේෂණ,අධීක්ෂණ හා විමර්ශන ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 02. <u>සම්පත්දායකයින් තෝරාගැනීමේ පොදු පටිපාටිය</u>

### 2.1 සම්පත්දායකයින් බඳවාගැනීම.

i. විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථාන සඳහා බඳවාගනු ලබන සියලුම සම්පත්දායකයින් විධිමත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය විය යුතුය. මේ සඳහා සම්මුඛ පරීක්ෂණයක් හා අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වීම මඟින් කැපවීමෙන් කටයුතු කළ හැකි සුදුසු සම්පත්දායකයින් තෝරා ගත යුතුය. ඒ ඒ විෂය සඳහා අවශ්‍යතාවය මත විශේෂ සුදුසුකම් සඳහන් කර විශ්වවිද්‍යාලය තුළ හා ප්‍රදේශයේ වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල සම්පත්දායකයින් බඳවා ගැනීම පිළිබඳ දැනුවත් කරන දැන්වීම් ප්‍රසිද්ධ කළ යුතු අතර එම පූර්ව ප්‍රචාරක දැන්වීම් සෑම වසරකම නොවැම්බර් 01 වැනි දිනට පෙර ප්‍රසිද්ධ කළ යුතුය.

ii. විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය අයත්වන අධ්‍යයන පීඨයේ පීඨාධිපතිගේ සභාපතිත්වයෙන් හා විෂය ප්‍රවීනතාවය සහිත අධ්‍යයන අංශවල කථිකාචාර්යවරුන්, ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී ඇතුළුව අදාළ විෂය පිළිබඳ දැනුම ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් තෝරා ගත යුතුය. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අවම සාමාජික සංඛ්‍යාව 03කි.

iii. සම්පත්දායකයින් ලියාපදිංචි කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින සම්පත්දායකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බැහැරව සම්පත්දායකයින් තෝරාගැනීමට අවශ්‍යනම් ඔවුන් ලියාපදිංචි කිරීම සඳහා සාධාරණ හේතූන් තිබේද යන්න සඳහන් කළ යුතුය.

iv. එක් සම්පත්දායකයෙකු උපරිම වශයෙන් එක් අංශයකට අයත් කුසලතා සංවර්ධන වැඩසටහන් 02 ක සම්පත්දායකයෙකු ලෙස තෝරාගත හැකි අතර ඒ සඳහා අමාත්‍යාංශයේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය.

උදා:
සංගීත අංශය - ජන සංගීතය, ශාස්ත්‍රීය සංගීතය
නැටුම් අංශය - උඩරට නැටුම්/ පහතරට නැටුම් නැතහොත් බෙර වාදනය

v. චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් සපුරාලන අමාත්‍යාංශයේ හෝ සංස්කෘතික මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරින් හට තම රාජකාරියට බාධා නොවන අයුරින් තම සති විවේක දිනවලදී සම්පත්දායකයකු වශයෙන් කටයුතු කිරීමට හැකිය.

vi. සියලුම සම්පත්දායකයින් විධිමත් සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා ගත් ලකුණු අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලින් තෝරා ගත යුතුය. එම සියලුම සම්පත්දායකයින් පිළිබඳ විස්තර, සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනය සමඟ අනුමැතිය හා ලියාපදිංචිය සඳහා අමාත්‍යාංශයේ වැඩසටහන් ඒකකය වෙත එවිය යුතුය.

## 03. <u>සම්පත්දායකයින් තෝරා ගැනීමේ සුදුසුකම්</u>

### 3.1 මූලික සුදුසුකම්

i. මනා චරිතයකින් යුක්ත වීම හා මනා මහජන සබඳතාවයක් පවත්වාගෙන යන අයෙකු විය යුතුය.
ii. මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. අවම වයස් සීමාව අවුරුදු 18 ක් ඉක්මවිය යුතුය.
iv. සම්පත්දායකයන් ලෙස තෝරාගන්නා පුද්ගලයන් නිරන්තරයෙන් විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානය හා බද්ධව කටයුතු කළ හැකි සංස්කෘතික මධ්‍යස්ථානයේ කටයුතුවලට අවහිර වන සේ ක්‍රියා නොකළ හා නොකරන පුද්ගලයන් විය යුතුය.

### 3.2 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

i. අදාළ ක්ෂේත්‍රය පිළිබඳව විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් ආයතනයකින් උපාධි/ ඩිප්ලෝමා සහතික ලබා ගත් අයෙකු විය යුතුය.

**හෝ**

ii. පාරම්පරික ශිල්පියෙකු වීම හෝ ශිල්පය පිළිබඳ හසල ප්‍රායෝගික දැනුමක් ඇති අයෙකු වීම.

## 04. <u>ලකුණු ලබා දීමේ පටිපාටිය</u>

### 4.1 වෘත්තීය සුදුසුකම්

i. වෘත්තීය පළපුරුද්ද (වසරකට ලකුණු 01 බැගින්) **- ලකුණු 10**
ii. පළපුරුද්ද හා විශේෂ ප්‍රාගුණ්‍ය සහිත පාරම්පරික ශිල්පියෙකු වීම **- ලකුණු 10**

### 4.2 අධ්‍යාපන සුදුසුකම් (අදාළ විෂය ක්ෂේත්‍රය තුළ) **- ලකුණු 20**

(අ.) උසස් පෙළ - ලකුණු 05
(ආ.) ඩිප්ලෝමා - ලකුණු 10
(ඇ.) උපාධිය - ලකුණු 15
(ඈ.) පශ්චාත් උපාධිය - ලකුණු 20
(මෙම ලකුණු ලබා දිය හැක්කේ උපරිම ලකුණු ලබා ගන්නා සහතික පත්‍රයට පමණි.)

### 4.3 අදාළ විෂය ක්ෂේත්‍රය තුළ පසුගිය වසර දෙකෙහි නිර්මාණාත්මක යම් ප්‍රසංගයක්, රඟදැක්වීමක්, ප්‍රදර්ශනයක්, සම්මන්ත්‍රණයක් පෞද්ගලිකව ඉදිරිපත් කර ඇතිනම් **- ලකුණු 10**

(අ.) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ - ලකුණු 05
(ආ.) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිට - ලකුණු 07
(ඇ.) ජාතික වශයෙන් - ලකුණු 10

(මෙම ලකුණු ලබා දිය හැක්කේ උපරිම ලකුණු ලබා ගන්නා අංශයට පමණි)

**4.4** පසුගිය වසර තුළ සංස්කෘතික මධ්‍යස්ථානයේ හෝ දිස්ත්‍රික්/පළාත්/ජාතික වැඩසටහන්වල හෝ සම්පත්දායකයකු ලෙස අදාළ විෂය ක්ෂේත්‍රයට අනුගතව යම් සුවිශේෂී නිර්මාණයක් කර ඇත්නම් හෝ ඊට ප්‍රමුඛ දායකත්වයක් ලබා දී ඇත්නම්

(එක් වැඩසටහනකට ලකුණු 03 බැගින්) **- ලකුණු 15**

**4.5** අදාළ විෂය ක්ෂේත්‍රය තුළ ජාතික හා පළාත් මට්ටමේ ලබා ඇති ජයග්‍රහණ **- ලකුණු 15**

| | ජාතික මට්ටම | පළාත් මට්ටම |
|---|---|---|
| ➢ ප්‍රථම ස්ථානය | - ලකුණු 06 | - ලකුණු 04 |
| ➢ දෙවන ස්ථානය | - ලකුණු 04 | - ලකුණු 03 |
| ➢ තෙවන ස්ථානය | - ලකුණු 03 | - ලකුණු 02 |
| ➢ කුසලතා හා සහභාගීත්වය | - ලකුණු 02 | - ලකුණු 01 |

**4.6** අදාළ විෂය ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති විශේෂ පුහුණුව, සහතිකපත් හා ඇගයීම් සඳහා (එක් සහතික පත්‍රයකට ලකුණු 05 බැගින්) **- ලකුණු 10**

**4.7** වෙනත් (පෞරුෂත්වය, ඉගැන්වීමේ හැකියාව, නායකත්වය, කණ්ඩායම් හැඟීම ආදී)

**- ලකුණු 10**

**(මුළු ලකුණු 100)**

## 05. <u>තෝරා ගත් සම්පත්දායකයින් ලියාපදිංචි කිරීම.</u>

වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානවල කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඔබ විසින් තෝරාගත් සම්පත්දායකයන් අනුමත කිරීම හා ලියාපදිංචි කිරීමට පහත සඳහන් ලිපි ලේඛන ලබා දී ඇති ඇමුණුම්වලට අනුව නොවැම්බර් 30 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යෙන්ම අමාත්‍යාංශයේ සංස්කෘතික වැඩසටහන් ඒකකය වෙත අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලෙන් යොමු කරන විට ප්‍රමාණවත් කාලයක් ඇති පරිදි කටයුතු කළ යුතු අතර තැපෑලේ දී සිදු වන ප්‍රමාදය ඔබගේ ප්‍රමාදයක් ලෙස සැලකීමට සිදු වේ.

**i.** ආවරණ ලිපිය (කුසලතා සංවර්ධන වැඩසටහන් නොපවත්වන මාස 03 පිළිබඳව මසකට කලින් අමාත්‍යාංශයේ ගිණුම් අංශයට පිටපතක් සහිතව හා සංස්කෘතික වැඩසටහන් ඒකකය වෙත දැනුවත් කළ යුතුය.)

**ii.** පිරික්සුම් ලයිස්තුව **(ඇමුණුම 01)**

**iii.** සම්පත්දායකයන් බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරන ලද පූර්ව ප්‍රචාරක දැන්වීම් පත්‍රිකාවේ පිටපතක්

**iv.** සම්මුඛ පරීක්ෂණ සාමාජික ලැයිස්තුව (අත්සන, දිනය හා නිල මුද්‍රාව සහිතව) **(ඇමුණුම 02)**

**v.** සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන්ගේ ලකුණු සහිත ලේඛනය **(ඇමුණුම 03)** (ලකුණු ලේඛනයේ සෑම පිටුවකම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගේ හා ස්ථානභාර නිලධාරීගේ නම, තනතුර, අත්සන හා දිනය, නිලමුද්‍රාව ඇතුළත් විය යුතුය.)

**vi.** තෝරාගත් සම්පත්දායක ලේඛනය (ලේඛනයේ සෑම පිටුවකම අධ්‍යයන පීඨයේ පීඨාධිපතිගේ අත්සන, දිනය හා නිලමුද්‍රාව සහ ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරීගේ නම, තනතුර, අත්සන හා දිනය, නිලමුද්‍රාව ඇතුළත් විය යුතුය. තවද තෝරාගත් සම්පත්දායකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංක අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය.) **(ඇමුණුම 04)**

vii. තෝරාගත් සම්පත්දායකයන්ගේ මාසික දීමනාව එම සම්පත්දායකයන්ගේ පුද්ගලික බැංකු ගිණුමට බැර කරන බැවින් බැංකු තොරතුරු සනාථ කරගැනීම සඳහා සම්පත්දායකයාගේ බැංකු පාස් පොතේ මුල් පිටුවේ සහතික කරන ලද පිටපතක්, සම්පත්දායකයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක් සහ සම්පත්දායකයාගේ සම්පූර්ණ කරන ලද බැංකු ගිණුම් තොරතුරු පිළිබඳ ආකෘති පත්‍රය **(ඇමුණුම 05)** සංස්කෘතික වැඩසටහන් ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

viii. විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයේ කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කාලසටහන **(ඇමුණුම 06)** සංස්කෘතික වැඩසටහන් ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 06. <u>කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම.</u>

**6.1** කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සාමාජිකයන් ලියාපදිංචිකිරීමට වෙනම ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

**6.2** ලියාපදිංචි කිරීමේ ලේඛනය CR පොතක පිටු දෙකක් භාවිතා කර සකස් කළ යුතු අතර එහි පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු වේ.

- **i.** අනු අංකය
- **ii.** ලියාපදිංචි අංකය
- **iii.** නම
- **iv.** ලිපිනය
- **v.** දුරකතන අංකය/ **WhatsApp** දුරකතන අංකය හා **E mail** ලිපිනය
- **vi.** හදාරන කුසලතා සංවර්ධන වැඩසටහන
- **vii.** ලියාපදිංචි ගාස්තු
- **viii.** හැඳුනුම්පත් අංකය
- **ix.** ගෙවන ලද කුවිතාන්සියේ අංකය හා දිනය

**6.3** සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ දී එක් එක් විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයන්හි සංවර්ධන සංගමයේ අභිමතය පරිදි ලියාපදිංචි ගාස්තු අයකර ගත යුතුය. එම ගාස්තුව තීරණය කිරීම සංවර්ධන සංගමය විසින් තීරණය කර (අවමය රු.300.00 සිට උපරිමය රු.1000.00) අමාත්‍යාංශයේ සංස්කෘතික වැඩසටහන් ඒකකය දැනුවත් කළ යුතුය. **(ඇමුණුම 07)**

## 07. <u>කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.</u>

**7.1** තෝරාගත් සම්පත්දායකයින් අමාත්‍යාංශය මඟින් අනුමත කළ බව ඔබ වෙත දන්වා එවීමෙන් පසුව පමණක් එම සම්පත්දායකයින් යොදවා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

**7.2** මෙම අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව කුසලතා සංවර්ධන වැඩසටහන් ආරම්භ නොකළ යුතු අතර තෝරා ගත් සම්පත්දායකයින් හා ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරි අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය. **(ඇමුණුම 08)**

**7.3** සම්පත්දායක දීමනා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අදාළ සම්පත්දායක පැමිණීමේ ලේඛනය, ශිෂ්‍ය පැමිණීමේ ලේඛනය, ඒ ඒ දිනට පරීක්ෂා කර බලා අවශ්‍ය පරිදි සැකසීම සිදු කළ යුතු බව අවධාරණය කරමි. එදිනෙදා පැවැත්වෙන පන්ති හා එහිදී ඉගැන්වූ පාඩම් පිළිබඳව සටහන් තැබීම සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන් පිළිබඳ වාර්තා පොතක් සකස් කර පවත්වාගෙන යා යුතුය. එහි මාසය හා දිනය, කුසලතා සංවර්ධන වැඩසටහන, සම්පත්දායකයාගේ නම, පන්ති පැවැත්වූ වේලාව සහ අදාළ දිනට සිදු කළ සිද්ධාන්ත/ ප්‍රායෝගික

පාඩම යන විස්තර අදාළ මාසය අවසානයේ දී පරීක්ෂා කර බලා නිවැරදි බවට සහතික කළ යුතු අතර කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම අධීක්ෂණය කිරීමට වග බලා ගත යුතුය.

## 08. <u>සම්පත්දායකයන් කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමෙන් ඉවත් වීම හෝ නිවාඩු ලබා ගැනීම.</u>

**8.1** සම්පත්දායකයන් ඉවත්වන අවස්ථාවකදී, දිගු කාලයක් අසනීප නිවාඩු ලබා ගන්නා අවස්ථාවකදී හෝ ප්‍රසූත නිවාඩු ලබා ගන්නා අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනයේ සඳහන් ඊළඟ අයදුම්කරුට අවස්ථාව ලබා දිය යුතුය. එවැනි අයදුම්කරුවන් නොමැති අවස්ථාවල විශ්වවිද්‍යාලයේ සංස්කෘතික මධ්‍යස්ථානය අයත් අධ්‍යයන පීඨයේ පීඨාධිපතිගේ සහභාගීත්වයෙන් යුත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ප්‍රමාණවත් සුදුසුකම් සහිත නව සම්පත්දායකයින් තෝරාගෙන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය.

## 09. <u>සම්පත්දායකයන් සඳහා ගෙවීම් කිරීම.</u>

**9.1** සම්පත්දායකයන් බඳවා ගැනීම් සඳහා අමාත්‍යාංශය අනුමැතිය ලබා දුන් දින සිට පමණක් ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත.

**9.2** අමාත්‍යාංශය විසින් අනුමත නොකරන ලද කිසිදු සම්පත්දායකයකු වෙනුවෙන් විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධන සංගමයෙන් මුදල් නොගෙවිය යුතුය. අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද මුදල් අයකර සිදු කරන ලබන කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සංවර්ධන සංගමයෙන් දීමනා ගෙවිය යුතුය.

**9.3** වර්ෂයේ කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සම්පත්දායක දීමනා ගෙවනු ලබන්නේ මාස 09 කට පමණි. එම කුසලතා සංවර්ධන වැඩසටහන් වර්ෂය පුරාම පවත්වන්නේ නම් ඉතිරි මාස 03 සඳහා සංවර්ධන සංගමයේ හැකියාව මත සම්පත්දායක දීමනාව සංවර්ධන සංගමයෙන් ගෙවීම නිර්දේශ කරන අතර ඒ සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය.

**9.4** එක් විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයකට මාසිකව හිමිවන උපරිම සම්පත්දායක දීමනා සීමාව රු.45,000.00 කි. සෑම විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයක්ම මුදල් අය නොකිරීමේ පදනම මත පවත්වන කුසලතා සංවර්ධන වැඩසටහන් 06 ක් හෝ ඊට වැඩි ගණනක් ක්‍රියාත්මක කළ යුතුය. මුදල් අයකිරීමේ පදනම මත පවත්වන කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා මෙම සීමාව අදාළ නොවේ.

**9.5** ගාස්තු අයකිරීමකින් තොරව පවත්වාගෙන යන කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා පැයකට රු.200.00 යටත්ව පැය 25 ක කාලයක් සඳහා උපරිම රු.5,000.00 දක්වා ගෙවීම් කරනු ලැබේ. එහිදී උපරිම සම්පත්දායක දීමනාව රු.45,000.00 නොඉක්මවන පරිදි ගෙවීම් කළ යුතුය.

**9.6** සම්පත්දායක දීමනා අයදුම් කිරීමේ දී නිවැරදි ශිෂ්‍ය සංඛ්‍යාව හා පැය ගණන සඳහන් කිරීම ස්ථානභාර නිලධාරීගේ වගකීම වේ. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බවට හෝ විධිමත් පරිදි අදාළ ලේඛන නඩත්තු නොකරන බවට තහවුරු වුවහොත් එම පාඨමාලාව අවලංගු කරන බව හා ගෙවා ඇති මුදල් වේ නම් එම මුදල වගකිව යුතු නිලධාරීන්ගෙන් නැවත අය කර ගැනීමට කටයුතු කරන බවද සැලකිල්ලට ගත යුතුය.

**9.7** එක් එක් මාසයේ සම්පත්දායක දීමනා අයදුම්පත් පිටපත් 03 කින්, අදාළ මාසයට පසුව එළඹෙන මාසයේ 10 වන දිනට පෙර සංස්කෘතික වැඩසටහන් ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍රවල මුල් පිටපතෙහි පමණක් සම්පත්දායකයාගේ අත්සන හා දීමනාව ලබා ගත් බවට සම්පත්දායකගේ අත්සන එම තීරු දෙකෙහිම තබා එවිය යුතුය. අනෙක් පිටපත් දෙකෙහි සම්පත්දායකයාගේ අත්සන් තීරුව පමණක් සම්පත්දායක විසින් අත්සන් කර එවිය යුතුය. **(ඇමුණුම 09)**

**9.8** මාසයට අදාළ සම්පත්දායක දීමනාව ගෙවීම සඳහා අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛ අංක 01/2021 පරිදි කටයුතු කළ යුතු අතර අදාළ ලේඛන එළඹෙන මාසයේ 10 දිනට පෙර සංස්කෘතික වැඩසටහන් ඒකකයට එවිය යුතුය. සම්පත්දායක ගෙවීම් වාර්තාව ගිණුම් අංශය මඟින්

සංස්කෘතික මධ්‍යස්ථාන වෙත යොමු කරන අතර එම දීමනාව ලබාගැනීමෙන් පසු සම්පත්දායකයාගේ අත්සන සහිතව අමාත්‍යාංශ ගිණුම් අංශය වෙත නොපමාව එවීමට ස්ථානභාර සංස්කෘතික නිලධාරි විසින් කටයුතු කළ යුතුය.

## 10. පොදු කරුණු

10.1 2023 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානයන්ට අනුබද්ධව ග්‍රාමීය සංස්කෘතික සමාජ පවත්වාගෙන යාම අනුමත කරනු නොලැබේ.

10.2 සම්පත්දායකයකු විශ්වවිද්‍යාලීය සංස්කෘතික මධ්‍යස්ථානය තුළ නීති විරෝධී ලෙස හෝ මධ්‍යස්ථානයට අයුතු බලපෑම් කරන බව වාර්තා වේ නම් කඩිනමින් ඒ බව අමාත්‍යාංශයට ලිඛිතව දැන්විය යුතු අතර අමාත්‍යාංශය මඟින් ඒ පිළිබඳව විමර්ශනය කොට අදාළ සම්පත්දායකයන් අසාධු ලේඛන ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

10.3 මෙම චක්‍රලේඛයෙන් මීට පෙර සම්පත්දායකයින් බඳවා ගැනීම සඳහා නිකුත් කර ඇති සියලු චක්‍රලේඛ අවලංගු වේ.

තිලක් නන්දන හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)

අත්/කළේ : සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය

දු/අංකය - 0112872005
ඊමේල් - culprmi@gmail.com
ෆැක්ස් - 0112879088

පිටපත්:

01. උපකුලපති , ................................ විශ්වවිද්‍යාලය
02. අතිරේක ලේකම් (පාලන)
03. ප්‍රධාන ගණකාධිකාරි
04. අධ්‍යක්ෂ (සැලසුම්)
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය

} කරු. අ.ක.ස / දැ.ගැ.ස